**සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය - 2018**

-----------------------------------------------------------

සීමාසහිත හිඟුරාන සීනි කර්මාන්තායතනය 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනය කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍ය සම්බන්ධව වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාදන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2007 අංක 07 දරණ සමාගම් පනතේ 150 (1) වගන්තියට අනුව, ශේෂ පත්‍රයේ දින සිට මාස හයක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වගකිව යුතු පුද්ගලයා විසින් සහතික කරන බවට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.

## 2.1 මූල්‍ය ප්‍රකාශන

----------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2016,2017 සහ 2018 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව නියමිත දිනට ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 අඛණ්ඩ පැවැත්ම

------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1993 වර්ෂයේ පුද්ගලීකරණයට යටත් වූ මෙම ආයතනය අසාර්ථක වීම නිසා නැවත 1997 වර්ෂයේදී රජයට පවරා ගත්තද 1998 වර්ෂයේ සිට කිසිදු නිෂ්පාදන ක්‍රියාවලියක් සිදු නොවූ බැවින් 2001 වර්ෂයේදී සියලු | පිළිතුරු ලබා දී නොමැත. | මෙම ආයතනයට අයත් වත්කම් දැනට ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමට පවරා ඇති නිසා මෙම ආයතනයේ ගණුදෙනු බේරා ඇවර කිරීමට කටයුතු කළ |

| | | |
|---|---|---|
| සේවකයන්ට වන්දි ගෙවා ඔවුන්ගේ සේවය අවසන් කර තිබුණු අතර මෙම කර්මාන්තායතනයට අයත් ඉඩම්වලින් කොටසක් සහ ගොඩනැගිලි අවුරුදු 30 ක බදු පදනම මත ලබාදී ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම පිහිටුවා තිබුණි. ආයතනයේ වත්කම් ආරක්‍ෂා කිරීම සහ පරිපාලන කටයුතු සඳහා 2016 වර්ෂයේදී සේවකයින් 9දෙනෙකු සේවයේයෙදී ඇති අතර වර්තමානය වන විට තාවකාලිකව පත් කරන ලද සාමාන්‍යාධිකාරිවරයකු පමණක් සේවයේයෙදී සිටී. ඒ අනුව මෙම ආයතනය නාමිකව තිබෙන ආයතනයක් බවට පත්වී ඇත. | | යුතුද යන්න සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුය. |

## 2.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ ගනුදෙනු වලට අදාල වවුචර්, මුදල් පොත, බැංකු ප්‍රකාශන ආදිය විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස අවස්ථා කිහිපයකදී ලිඛිතව දන්වා සිටියද ඒවා විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | පිළිතුරු ලබා දී නොමැත. | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව ඉල්ලා සිටිනු ලබන තොරතුරු සහ පැහැදිලි කිරීම් විගණකාධිපතිවරයා වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------ | ------------ |
| (අ) | කර්මාන්තායතනයට අයත් හෙක්ටයාර් 277.73 ක ඉඩම් හා ඊට අදාළ කම්හල් ගොඩනැගිලි වර්ෂ 30 ක කාලයක් සඳහා බදු පදනම මත සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම වෙත 2007 වර්ෂයේදී ලබාදී තිබුණි. 2009 මාර්තු 06 දිනැති අංක 09/ 0398/ 329/ 003 සහ 2009 මාර්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බදු ගිවිසුමක් පිළියෙල කොට ඒ සඳහා නීතිපතිගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බදු ගිවිසුමක් පිළියෙල කර නීතිපතිගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ගොවීන් 4493 ක් අතර අක්කර 2.5 බැගින් අක්කර 11232 ක් බදු ගිවිසුම් වලින් ලබාදී තිබුණද, එම ඉඩම්වලින් බදු මුදල් අයවී නොතිබුණු අතර එම බදු ගිවිසුම්වල කාලයද ඉකුත්වී තිබුණි. ඒ අනුව අලුතින් බදු ගිවිසුම් අත්සන් කර ඒවා පැවරීමට හා බදු මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බදු ගිවිසුම් නැවත අලුත් කර අදාල බදුකුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කර්මාන්තායතනය සතුව තිබෙන වත්කම් හා තොග සම්බන්ධයෙන් වසර 20 කට අධික කාලයක සිට භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබූ බැවින් වත්කම්වල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වත්කම්වල පැවැත්ම හා ඒවායේ නිවැරදිතාවය පරීක්ෂා කර ගැනීම සඳහා වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කළ යුතුය. |
| (ඈ) | කර්මාන්තායතනයට අයත් නිල නිවාස 273 කින් නිවාස 91 ක අනවසර පදිංචිකරුවන් පදිංචිවී සිටින අතර ඔවුන් ඉවත් කිරීමට නීතිමය කටයුතු කර නොතිබූ අතර අනෙකුත් නිවාස වලින් කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමට සහ නිවාස කුලී මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | නාරාහේන්පිට කාර්යාලය තුළ බෝතල් නිෂ්පාදනාගාරයට අයත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, යතුරුපැදි 3 ක් මෝටර් රථයක්ද, හිඟුරාන කම්මල් පරිශ්‍රයේ තිබෙන යන්ත්‍ර උපකරණ ඇතුළු වත්කම් 1997 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතීම නිසා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණු අතර ඒවා අපහරණය කර රජයට ආදායමක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | පාවිච්චියට ගත නොහැකි වත්කම් නැවත තක්සේරු කර අපහරණය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | කර්මාන්තායතනයේ පවතින සියලුම වත්කම් පිළිබඳව රජයේ තක්සේරු වාර්තා ලබාගැනීමට කටයුතු කළ යුතු බවට කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2018 | පිළිතුරු ලබා දී නොමැත. | පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී ඇති නියෝගය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය |

| | | | |
|---|---|---|---|
| | පෙබරවාරි 27 දිනැති ලිපිය මඟින් දැනුම් දී තිබුණු අතර 2017 පෙබරවාරි මස පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කර්මාන්තායතනය ඇවර කිරීම සඳහා වත්කම් සහ වගකීම් හඳුනාගෙන ඒවා නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු බවට නියෝග කළ තිබියදී මේ දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (උ) | හිඟුරාන සීනි කර්මාන්තායතනය සතුව ප්‍රයෝජනයට ගත හැකි රු. මිලියන 222 ක් වටිනා වත්කම් සහ තොග ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමට පවරා දී තිබුනද එම වත්කම් හිඟුරාන සීනි කර්මාන්තායතනයේ ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාල වගකිව යුතු ආයතන විසින් අවශ්‍ය උපදෙස් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සේවකයින් ඉවත් කිරීමට පෙර හිඟුරාන පරිශ්‍රය තුළ සහ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයේ පවතින වත්කම් නිසි පරිදි වගකිවයුතු නිලධාරීන්ට භාරදීමට අවශ්‍ය කටයුතු නොකර සේවකයන් ඉවත් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සේවකයින් භාරයේ පවතින වත්කම් ඔවුන් සේවයෙන් ඉවත්වීමට පෙර වගකිවයුතු නිලධාරියෙකුට භාරදී සේවයෙන් ඉවත් වීමට කළමනාකාරිත්වය වගබලා ගත යුතුය. |

## 3.2 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ මාර්තු මාසය දක්වා නාරාහේන්පිට කාර්යාලයේ සේවකයින් 06 දෙනෙකු සහ හිඟුරාන කාර්යාලයේ නිලධාරීන් 03 දෙනෙකු රජකාරියේ යෙදී සිටි අතර 2017 මාර්තු 29 දිනැති ලිපිය මඟින් 2017 පෙබරවාරි 28 දින සිට සේවකයින් 5 දෙනෙකුගේ සේවය අවසන් කර තිබුණි. 2018 වර්ෂය අවසාන වන විට සේවකයින් දෙදෙනෙකු පමණක් සේවයේ යෙදී තිබුණි. වර්තමානය වන විට එක් නිලධාරියෙකු පමණක් සේවයේ යෙදී සිටී. | පිළිතුරු ලබා දී නොමැත. | ආයතනයේ ගණුදෙනු බේරා අවසන් කරන තුරු අදාල පොත්පත් ලේඛන සහ වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |